# බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
# <u>උපාධි සහතික නිකුත් කිරීම පිළිබඳ දැනුම් දීම.</u>

01. උපාධි සහතික ලබාගැනීම සඳහා උපාධිලාභියා පෞද්ගලිකවම බාහිර විභාග අංශය වෙත පැමිණිය යුතුය.

02. උපාධිලාභියාට පෞද්ගලිකව බාහිර විභාග අංශයට පැමිණීමට නොහැකි අවස්ථා වලදී පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

   I. වෙනත් අයෙකුට තම උපාධි සහතිකය ලබා දෙන ලෙස කරන ලද ලිඛිත ඉල්ලීම සමග ඒ සඳහා තම අනුමැතිය ලබාදෙන බව සඳහන් දිවුරුම් ප්‍රකාශයේ අදාල සහතිකය ලබා ගැනීමට පැමිණෙන පුද්ගලයාගේද විස්තර ඇතුලත් කිරිම.
   ( දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.)

   II. ඇටර්නි බලපත්‍රලාභියෙකු නම් එම බලපත්‍රයේ සහතික කළ පිටපතක් සහ උපාධිලාභියාගේ ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම.

   III. උපාධි සහතිකය ලබා ගැනීමට පැමිණෙන අයගේ ජාතික හැඳුනුම්පත හා එහි සහතික කළ පිටපතක් ඉදිරිපත් කිරීම.

03. උපාධිලාභියා හෝ බලය පැවරූ වෙනත් අයෙකු උපාධි සහතිකය ලබා ගැනීමට පැමිණීමේදී උපාධිලාභියාගේ ජාතික හැඳුනුම්පත හා ශිෂ්‍ය වාර්තා පොත ඉදිරිපත් කිරිම අනිවාර්ය වේ.

   ජාතික හැඳුනුම්පත නොමැති අවස්ථාවල විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය ඉදිරිපත් කළ හැකිය.එහිදි උපාධිලාභියාගේ නමේ නිවැරදිභාවය තහවුරු කර ගැනිම සඳහා උපාධිලාභියාගේ උප්පැන්න සහතිකයේ සහතික කල පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

04. අස්ථානගතවූ උපාධි සහතික වෙනුවෙන් නැවත සහතිකයක් නිකුත් කිරීමේදි උපාධි සහතිකය නැති වූ බවට දිවුරුම් ප්‍රකාශයක් සමග ග්‍රාම නිලධාරි සහතිකය සහ පොලිස් සහතිකය යන සහතික තුනම (03) ඉදිරිපත් කල යුතුය.

නියෝජ්‍ය ලේඛකාධිකාරි
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය